# මුතු කරාබුව

තරංගජයසේන



## කවි- කඳුළු සහ කළුවර



ඔබ කම්මැළි කියවන්නෙක්ද? එහෙනම්, මුතු කරාබුව ඔබට නොවේ. මේ කතාබහ සමග සෙට් වීමට නම් ඔබ මගේ කොන්දේසි පිළිපදින්ඩෝනෙ. බැරිනම්, යන්න අනේ තරහ නොවී වෙන වැඩක් බලාගන්න. මේක කියවන්ඩෝනෙ රෑ. තනියම. කුටියේ පහන් නිවලා ඉටිපන්දමක් දල්වා ගන්න. ඉටිපන්දම් එළියෙන් ඔබට මුතු කරාබුව ලස්සනට පෙනෙයි. සංගීතයක් වාදනය කළ හැකි මොකක් හරි යන්ත්‍රයකුත් ළඟට ගන්න. දැන් හැම දෙයක්ම නිහඬයි. උස වීදුරුවකට ඔබ කැමති බීමක් වත්කරගන්න. (මධු? හ්ම් ඕනෙනම්! මන්දා.)
හුඟාක්ම හිමින් ලස්සන මියුසික් එකක්- වචන නැති- ප්ලේ කරන්න පුළුවන්නම් මරු. හොඳයි. මම කෙළින්ම වැඩේට යනවා.
එකයි. දෙකයි. තුනයි. කියවන්න.

**මුතු කරාබුව**
**තවම මා ළඟ**
**තනිව පැළඳිය**
**නොහැකි අනෙකද**
**ඔබේ කුටියෙහි**
**නැතිව ඇති අද**

ජේනවද ඉටිපන්දම් දැල්ල හෙමින් නටනවා. චුට්ටක් ඇස් පියාගෙන හෙමින් එළිය මැකී යන හැටි අත්විඳින්න. ඒ කවි පේළි කොහෙද ඔබව ගෙනියන්නේ? (මම මේ කව මුල්වරට විඳගත්තේ මහ දවල් බස් එකක වාහන සද්ද, කපුටු සංගීත මැද්දෙ. ඔබ එය විඳ ගන්නේ හරි අපූරු විදිහටනේ. බලන්නකො.)
ඔබ හුඟක් සංවේදී නම් ඔබේ ඇස් වලට කඳුළු එයි. මං දන්නෙ නෑ. ඒත් ඒ කව ඒ වගේ. සමහර විටෙක ඔබ හඬන්නේ ඔබේම මුතු කරාබුව සිහි වීමෙන් වෙන්නටත් පුළුවන්. එහෙම නැත්නම්, කවියාගේ අත්දැකීම ඔබ සංවේදී කළ නිසා වෙන්නටත් පුළුවන්.
අනුන්ගේ විරහව වෙනුවෙන් වුනත් හඬන්නට ඔබට හැකි වුනේ කොහොමද? ඒ ඔබ අනික් අයට වඩා වෙනස්- හොඳටෝම වෙනස් ආදරණීය කෙනෙක් වූ හන්දා නේද? ආදරය ගැන මොහොතක් හිතන්න. පොඩ්ඩක් සංගීතය වැඩි කරලා ඇස් පියාගන්න.

හරි එන්න.
රෑ අඳුරේ මුතු කරාබුවක් ළඟ සංවේදී වෙන ඔබේ ආදරණීය ආත්මය රැය පහන් වූ පසුවත්- හෙට දහවලේත් හැන්දෑවේත් මුළු මහත් ජීවිතය පුරාවටත් පවත්වා ගන්න. අනුන්ගේ වේදනා වෙනුවෙන් හඬන්නට පටන් ගන්නවාත් එක්කම ඔබ ඇත්තටම ආදරේ කරන්න පටන් ගන්නවා. ඇහුණද මං කිවුව දේ? ආයෙ මුල ඉඳන් කියවන්න.

හරි එන්න.

රෑ අඳුරේ මුතු කරාබුවක් ළඟ සංවේදී වෙන ඔබේ ආදරණීය ආත්මය රැය පහන් වූ පසුවත්- හෙට දහවලේත් හැන්දෑවේත් මුළු මහත් ජීවිතය පුරාවටත් පවත්වා ගන්න. අනුන්ගේ වේදනා වෙනුවෙන් හඬන්නට පටන් ගන්නවාත් එක්කම ඔබ ඇත්තටම ආදරේ කරන්න පටන් ගන්නවා. ඇහුණද මං කිවුව දේ? ආයෙ මුල ඉඳන් කියවන්න.

දැන් අපි මාරු වෙනවා දුම්රිය නැවතුම් පොළකට. දැරියක් සහ ගුරුවරයෙක්. තෙරක් නොපෙනෙන අනාගතයට ඇ රැගෙන යන්නට ආ දුම්රියක්. ගුරුතුමා අයිලයේ තනිකොට ඇ රැගෙන යන්නට ආ දුම්රියක්.

**"අඬන්ට එපා අල්තීනායි. අපි දෙන්නා හිටවපු පොප්ලර් ගස් දෙක මම බලාගන්නම්." දුයිෂෙන් කීය. "උඹ ලොකු උගත් ගෑනියෙක් වෙලා ගමට එනකොට ඒ ගස් ලස්සනට වැඩිලා තියේවි."**
**දුම්රිය, ශබ්ද කරමින් දුම් ගුලි පිට කරමින් පදික වේදිකාවට ළංවිය. දුයිෂෙන් මගේ නළල සිප ගත්තේය.**
**මම දුම්රියේ පාපුවරුවට පැන හැරී බැලුවෙමි. තුවාල වූ අත වෙලා බැඳ ගෙන සිටි දුයිෂෙන්ගේ මලානික ඇස් මා දෙනෙතට හමු විය. ඔහු එදා මා දෙස බලා සිටි හැටි මට කිසිදිනෙක අමතක නොවේ. මා ඇල්ලීමට මෙන් ඔහු අත දිගු කරත්ම දුම්රිය ගමන ඇරඹීය.**
**දුයිෂෙන් දුම්රිය මැදිරිය අසලින් අඩි කීපයක් දිව්වේය. පසුව නැවතී මහ හඬින් කෑගැසීය.**
**"අල්-තීනා-යි!"**
**ඔහු කෑ ගැසුවේ හරියට අමතක වූ වැදගත් යමක් කියන්නට සූදානම් වූ නමුදු එසේ කීමට වෙලාවක් නැතුව ගියාක් මෙනි. මගේ හදවතෙහි පතුල දක්වා සහ අධ්‍යාත්මයෙහි ගැඹුර දක්වා විනිවිද ගිය ඔහුගේ හඬ තවමත් එහිම සුරැකිව පවතී.**

දුයිෂෙන් ළඟද අල්තීනායිට පැළඳිය නොහැකි වූ මුතු කරාබුවක් තිබෙන්නට ඇත. ප්‍රබන්ධයක, සමතල පත් ඉරුවක පවතින ආදරයක් වෙනුවෙන්- කිසිදින මුණ නොගැසෙන- අහසේ තරුවක පරිස් සමට සඟවා තබන ලද- කිසිදා පැළඳිය නොහැකි මුතු කරාබුවක් වෙනුවෙන් දැන් ඔබට හැඬිය හැකියි නේද? අල්තීනායි යළි එනවා. ඒත් ඔහු නැහැ. හිස් තැනක්? හැම ආදර කතාවක්ම එක වගේ. පාවුලෝ කොයියෝ කියනවා.

දැන් උන්මාද සිතුවම් ගීතය අහන්න යන්නෙ අපි. කෝ එන්න. ඉන්න තැනම පොළවේ. ඔව් සිමෙන්ති පොළවේ වැතිරිලා සූදානම් වෙන්න.

මාලනී ලයිට් හවුස් එකට එන සීන් එක මතකද? කෝ ඔන්න- ඔන්න ලිහිණින්ගේ සද්දේ. මුහුද වැලපෙන සද්දේ. ජේනවද ඔබට ඈ අතේ ඇති මුතු කරාබුව? ආයෙත් මුහුද. ගල්පර වල වැදී රළ බිඳෙන හඬ පසාරු කරගෙන ගීතය ඇහෙන්න ගන්නවා. මාලනී ලයිට් හවුස් එකේ පඩි පෙළ නගිනවා.

**උන්මාද සිතුවම් මැවේ බිඳේ**
**මිහිදුම් වලා මැද අතීතයේ**
**බිඳුණු පෙමින් ගිනිගත් හදවත්**
**තනිවේවි එක්ටැම් ගේ**

**අනන්ත සයුරේ බියකරු දිවි දියඹේ**
**පාළු හුදකලා සුළඟ පමණි උරුමේ**
**හඬා වැටෙන සිත සදා සරණ මට**
**තනිවේවි එක්ටැම් ගේ**

**උන්මාද සිතුවම්...**

**දහසක් මල් මැද එකම මලයි පැතුවේ**
**එමල කිමද සරදම් කර සැඟව ගියේ**
**දැනේ තවම මට මලේ සුවඳ පොද**
**තනිවේවි එක්ටැම් ගේ**

**උන්මාද සිතුවම්...**

බොහෝ හුදකලා මුතු කරාබු සමග සැඟවුනු කතාවක් තියනවා නේද? ඒ හැංගුණු කඳුළු වලට වග කියන්න ඕනෙ ආදරය වෙනුවට වෙන් වීම යෝජනා කරන අපිම හදාගත්තු පූර්ව විනිශ්චයන්. ඒවා වෙලාවකට පුංචි පුංචි ආණ්ඩු වගේ අපිව ආණ්ඩුමට්ටු කරනවා. හිතන්න. ඒ ආණ්ඩුවලට පහර දෙන්නට පුළුවන් නම්... ඒ ආණ්ඩු පෙරළලා මැරෙන්න පුළුවන්නම් අපේ දරුවන්ට කිසි දවසක අපිට වගේ තනි වුනු මුතු කරාබුවක් එක්ක වැලපෙන්නට වෙන එකක් නැහැ නේද?
ඔබට වෙහෙසද?
තව එකම එක ගීයක් අහමුද?
ඔබ ළඟ විතෙහි ඇත්තේ මධු නම් මේ එයට වේලාවයි.

**සඳ තරු නිහඬයි**
**ගහ කොළ නිසලයි**
**මුළු ලොව සැතපෙයි**
**සිතිවිලි විතරක් අවදි වෙලා**

**පියා නුවන් යුග නිවා තැවුල් සිත**
**සැතපෙන්නට වෙර දරන පැයේ**
**පාළුව තනිකම කුටියට ඇවිදින්**
**හදවත අවදි කලා**

**මවා නුවන් ඔබ ඔබේ තෙපුල් සර**
**සිහිනයකින් මෙන් ගලා රැයේ**
**සෙනෙහස හඬවා මතකය ඉකිබිඳ**
**හදවත අවදි කලා**

දැන් ඔබට ඉටිපන්දම නිවා දැමිය හැකියි. මුතු කරාබුවේ එළියෙන් කවියක් ලියන්නට දැන් ඔබට පුළුවන්. නැත්නම් එළියට ගිහින් හඳ බැලුවොත් කොහොමද? මන්දා. කවක් ලියාගෙනම ඒකත් අරන් එළියට ගියොත්...? හැකිවෙයි කවිය සඳ එළියේ තබා බලන්නට.

**තරංග ජයසේන**
koombiyaonline@gmail.com

***කොලම ගැන පසු සටහනකි මේ.***

මුතු කරාබුව කව ලක්ශාන්ත අතුකෝරාළගේ "අමාවකේ සඳක් සිඹිමි" කවි පොතෙන්. සන්නස කොලමට නමත්, එහි ෆෝමැට් එකත් ඔළුවට ආවේ ලක්ශාන්තගෙ මේ අපූරු කව කියවා දිගට දිගට හිතමින් හයිලෙවල් පාරේ 138ක පට්ට ට්‍රැෆික් එකක ඉන්දැද්දී. ඒ විශාල ට්‍රැෆික් මවන අයට මං කවදත් ණය ගැතිය.
ප්‍රබන්ධ වියමන චිංගීස් අයිත්මාතව්ගේ ගුරු ගීතයෙන්. සිංදු දෙක පිළිවළින් කපුගේ සහ අමරදේව ගැයූ ඒවා.




